


# අලුත් පාලමේ කතාව

1. එකමත් එක කාලෙක ලේනෙකුයි හාවෙකුයි ගොරිල්ලෙකුයි අලියෙකුයි හිටියා. ඒ හතර දෙනා බොහොම යාළුයි. ඒ ගොල්ල උන්නෙ කන්දක් පාමුල. ඒ ළඟින් ම ඔයක් ගලනවා. ඔයට එහා පැත්තෙ මහ වනාන්තරයක්.





2. හැම අවුරුද්දෙම සරත් කාලෙට මේ හතර දෙනා එකතු වෙලා අර වනාන්තරේට යනවා. ගිහිල්ලා, පලතුරු ජාති, ගෙඩි ජාති එකතු කරනවා. උන් සීත කාලෙට ගන්න ඒවා ගබඩා කරලා තියා ගන්නවා. ලේනා කඩිසරයි. හාවා උනන්දුයි. බර දේවල් ගෙනියන්න ගොරිල්ලාට පුළුවනි. අලියාට නුවණ තියෙනවා.





3. දවසක් වටින් ගොඩින් එළිය වැටීගන එනකොට ලේනා අවදි වෙලා, වෙනද වගේම ඔය ළඟට ගිහින් රුස්ස ගහක් උඩට නැගලා ටිං ටිං ගගා, ව්‍යායාම කරන්න පටන් ගත්තා. "එකයි! දෙකයි! තුනයි! හතරයි!" ඒ වෙලාවෙ අර ඔයේ වතුර හෝ හෝ ගාලා වේගෙන් ඉහළ නගිනවා. එනකොට අර ඔයේ ලී පාලම 'බරාස්' ගාලා කඩන් වැටිලා, වතුරට ගහගන ගියා.



ල්නා දුවලා ගිහිල්ලා ගහ මුදුනට නැගලා
ෑ ගහන්න පටන් ගත්තා: ''අනේ,
මන්න, ලී පාලම වතුරට ගහගෙන
නවෝ.''











5. ඒ හඬ ඇහිලා හාවා ඔය ළහට දුවගන ආවා. ''දැන් ඉතින් අපි මොකද කරන්නෙ?'' ඌ බිම හැපි හැපි විලාප කියන්න පටන් ගත්තා.



6. ගොරිල්ලාත් පරක්කු වුණේ නැහැ. ඌ ඇවිත් ඔළුව කහ කහ කල්පනා කරන්න පටන් ගත්තා.



7. ලේනා තාත්තුවාවෙන් මෙහෙම කිව්වා:
''පාලම වතුරට ගහගෙන ගිහිල්ලා. ඉතින් අපි පලතුරු නෙලන්න ඔයෙන් එගොඩ වෙන්නෙ කොහොම ද? අපට බඩගින්නෙ ඉන්න වේවි.''



8. අලියා ටිකක් කල්පනා කෙරුවා. ඌ හොඬවැල වන වන මෙහෙම කිව්වා: ''කලබල වෙන්න ඕන නැහැ. අපි කවුරුත් එකතු වෙලා වැඩ කෙරුවොත් අලුත් පාලමක් හදගන්න පුළුවනි.''








9. අන්න හරි! අන්න හරි!" කියලා, ලේනා යොතක් ගේන්න දුවලා ගියා. හාවා ගියා කුඩ වියන්න. ගොරිල්ලා පොරොව මුවත් තියන්න දුවලා ගියා. අලියාත් කත් ලීයක් ගෙනාවා.







0. මේ වෙලාවෙ කපටි නරියෙක් කැලෑවෙ හැංගිලා ඉඳගන මේ කථාව හොරෙන් අහගන උන්නා. උගේ ඇස් පිහාටු ඇකුලුණා. මේ වැඩ පිළිවෙල කඩා කප්පල් කරන්නයි උගේ අදහස.

11. නරියා හොරෙන්ම ගොරිල්ලාගෙ ගෙදරට රිංගුවා. බැලින්නම්, ගොරිල්ලා දෙරකඩ ළඟ ඉඳගන පොරොව මුවත් තියනවා. නරියාත් බොරු හිනාවක් දලා ගොරිල්ලා ළඟට ගිහින් මෙහෙම කිව්වා: ''ලේනාටයි හාවාටයි වැඩිය ඔයාට හයිය තියන පලියට, ඔයා විතරක් ඔච්චර මහන්සි වෙන්නෙ මොකට ද? ඒක සාදරණ නැහැ.''




12. ගොරිල්ලා. ඇහිපිල්ලන් ගහගහ කල්පනා කරන්න පටන් ගත්තා: ''ඔව්, නරියා කියන කතාව හරි. ඒ ගොල්ලන් එක්ක වැඩ කරලා මට ඇති ලාබෙ මොකක් ද ? ගොරිල්ලා පොරොව අල්ලලා පැත්තකට වීසි කෙරුවා.



13. ඊළඟට නරියා රිංගුවෙ හාවා ඉන්න තැනටයි. හාවා කලබලේ කුඩ වියනවා. නරියා දත් නියවලා ඔරවලා බලලා හාවා බය ගැන්නුවා: "තෝ මං කියන කතාව හොඳට අහපිය. ඔය පාලම හදන්න මම ඉඩ දෙන්නෙ නැහැ; තෝ මේ ගෙදරින් පිට වෙන්නෙ බලාගනයි, පිට වුණොත් හෙම, මං තොගේ කකුල් කඩලා මරාගන කනවා."



14. නරියාගෙ කතාවට හාවා හොඳටම බය වුණා. ඌ, කර කියා ගන්න දෙයක් නැතුව බයෙන් ගැහි ගැහි ගෙදරටම වෙලා හිටියා.



15. ලේනා යොතක් අරගෙන ඔය ළඟට ආවා. එතකොට අලියා කත් ලීය හොඬ වැලෙන් අරගන එතැනට ඇවිත් උන්නා.



16. ලේනයි අලියයි ඉර මුදුන් වෙලාව වෙන තුරුම අනිත් දෙන්නා එනකන් ඔය ළඟ බලාගන උන්නා. පැයක් ගත වුණා. දෙකක් ගත වුණා. ඒ වුණාට හාවයි ගොරිල්ලයි ජේන මානෙක වත් නැහැ. ලේනා අලියට කතා කරලා මෙහෙම කිව්වා: ''අනේ! අපි දෙන්නා උදේ ඉඳන් මෙච්චර වෙලා බලාගන උන්නා. මොකද ඒ දෙන්නා තාම නැත්තෙ? මම ගිහින් අඬ-ගහගන එන්නම්කො.'' මෙහෙම කියලා ඌ පිටත් වෙලා ගියා.





17. වැඩි වෙලාවක් ගියෙ නැහැ. ලේනා හති දමාගෙන ආපහු ආවා. ඌ මූණෙ දඩිය පිහ දම දම අලියාට මෙහෙම කිව්වා: ''ඒ දෙන්නා එන්නෙ නැහැ. ඒකට කමක් නැහැ. අපි දෙන්නා විතරක් වත් පාලම හදන්න බලමු.''







මෙහෙම කියලා ලේනා මහ ගහකට නැග්ගා. නැගලා, පුළුවන් තරම් හයියෙන් ඇදලා පුංචි අත්තක් කඩාගන ඇවිත් අලියාට දුන්නා. ඉතින් අලියා ඒ අත්ත දිහා බලන් ඉදලා ලේනට මෙහෙම කිව්වා: ''මේක හයිය නැහැ. මේකෙන් ලී පාලමක් හදන්න බැහැ.''

19.ලේනා ඔය දිහාව බලාගන ඉඳලා, අලියාට කිව්වා: ''එහෙනම් අපි හොඳ හයිය ඇති කොටන් කිපයක් හොයා ගන්න ඕන.'' ඌ ලොකු ගහකට නැගලා පුළුවන් තරම් හයියෙන් ඒක හෙලෙව්වා. ඒ වුණාට ඒ ගහ පොඩ්ඩක් වත් හෙල්ලුණෙ නැහැ.



තකොට අලියා හොඬවැල වන වන මෙහෙම
ව්වා: ''මේක අපි දෙන්නාට විතරක්
රන්න පුළුවන් වැඩක් නෙවෙයි ගොරිල්ලාට
බාහොම හයිය තියනවා. ලී පාලමට කණු
ටවන්න එයාට පුළුවනි. කුඩ වියන්න
ාවාට පුළුවනි. ඒ දෙන්නා නැතුව පාලම
දන්න අපි දෙන්නාට බැහැ. කවුරු මොන
මොන වැඩේ කෙරුවත්, කවුරුත් එකතු
වෙලා වැඩ කරන්නෙ නැතුව, මේ පාලම
දන්න පුළුවන් වෙන්නෙ නැහැ.''





21. ඊළඟට අලියා ලේනත් එක්ක හාවාගෙ ගෙදරට ගියා. හාවා කිව්වා, නරියා ඇවිත් තමන් බය ගන්නපු හැටි. එතකොට අලියා හාවගෙන් ඇහුවා: ''මීට ඉස්සර වරක් නරියා ඇවිත් ඔයා බය ගන්නපු හැටි මතක ද? එද අපි කවුරුත් එකතු වෙලා ඌට හොඳටම ගහලා, ඌ එළවලා දැම්මා. අපි සමගි වෙලා ඉන්න කොට අපට ලොකු බලයක් තියනවා. එතකොට කොයි විදියෙ හතුරෙක් ආවත් අපි බය නැහැ.''



22. එද නරියා පරද්දපු හැටි හාවට තාම මතකයි. ඌ අනිත් යාළුවො දෙන්නාට මෙහෙම කිව්වා: ''ඔව්! අලියා කියන කතාව හරියට ම හරි. අපි එකමුතු වෙලා වැඩ කෙරුවොත් අලුත් පාලම හදගන්න පුළුවනි, ඒ වගේම නරියා පරද්දන්නත් පුළුවනි.''




23. ඊළඟට ඒ තුන් දෙනා ගොරිල්ලා හම්බ වෙන්න ගියා. අලියා ගොරිල්ලාගෙන් තොරතුරු ඇහුවා. ඌ නූල් පටක් ගොරිල්ලාගෙ අතට දීලා කිව්වා, ඒක කඩන්න කියලා. ගොරිල්ලා එකපාරටම නූල් පට දෙකට කඩලා පෙන්නුවා. ඊළඟට අලියා නූල් පටවල් ගණනාවක් එකට අඹරලා හදපු ගන නූලක් ගොරිල්ලාට දුන්නා. ගොරිල්ලා දත් මිටි කාගෙන බොහොම මහන්සි ගත්තා. ඒ වුණාට ඒක කඩන්න ඌට බැරි වුණා. ලැජ්ජාවෙ උගේ මූණ රතු වුණා.



24.ගොරිල්ලා බිම බලාගන අලියාට මෙහෙම කිව්වා:
''ඔයා කියන කතාව හරි. මම නරියට රැවටුණා''.




25. යාළුවො හතර දෙනා ආයෙත් සමගි වුණා. ඒගොල්ල එකමුතු වෙලා ලී පාලම හදන්න වැඩ පිළිවෙලක් යෙදුවා; ඒ වගේම කපටි නරියා අල්ලගන්න උගලකුත් ඇටෙව්වා.






26. ඒ ගොල්ල ඉස්සෙල්ලා බොරු වළක් කැපුවා. ඊළඟට එක එක්කෙනා තම තමන්ට බාර වැඩ කරන්න ගියා. ගොරිල්ලා පොරොව අරන් ගස් කපනවා. අලියා ඒ ගස් හොඬ වැලෙන් උස්සගෙන අරන් යනවා.





27. ලේනා ගහෙන් ගහට පැන පැන වැල් එකතු කරනවා. හාවා ඒ වැල් අරගන කූඩ වියනවා.



28. ඉවුරේ ලී කොටන් ගොඩ ගැහුණා. ලේනා අර කඹේ එක කොනක් මහ ගහක බැදලා අනිත් කොන ඉනේ බැඳ ගත්තා. එතකොට අලියා ඇවිත් ලේනා හොඩ වැලෙන් උස්සලා අරගන, ඔයෙන් එගොඩහට වීසි කෙරුවා.



29. ඒ පාර ලේනා ඉන වටේ බැඳගන උන්න කෙ
කොන ලිහලා ගත්තා. ලිහලා අරගන, ඒක
පැත්තෙ මහ ගහක බැන්දා. දැන් ඒ කඹේ කො
දෙක ඔයේ දෙපැත්තේ මහ ගස් දෙකක බැඳල
තියෙන්නෙ. ඊළඟට ලේනා කුඩ තුනක් කෙ
දිගේ එල්ලුවා. ලේනයි හාවයි ගොරිල්ලයි
කුඩවල ඉඳගන පාලමේ වැඩ කරනවා.

0. ගොරිල්ලා මිටියෙන් ගහ ගහ පාලමට කණු හයි කරනවා. ලේනයි හාවයි ඒ කණු උඩ පැත්තට හිටින විදියට ලෑලි දමනවා. අලියා කොටන් ගෙනියනවා. ලෑලි ගෙනියනවා. ඒ එක්කම නරියා ගැනත් හෝදිසියෙන් ඉන්නවා.





31. කපටි නරියා සද්ද නැතුව හෙමින් හෙමින් අඩිය තිය තිය ආයෙත් ඔය ළඟට ආවා. ඉතින් යාළුවෝ හතර දෙනා එකමුතු වෙලා වැඩ කරනවා දැක්කාම ඌට කේන්ති ගියා. දත් කුරු කකා ඌ මෙහෙම හිතුවා: ''මම දැන් හොරෙන් ම ගහ ළඟට ගිහිල්ලා අර කඹේ විකලා විකලා කඩලා දාන්න ඕන. එතකොට අර තුන් දෙනා ඔයට වැටිලා මැරේවි''.

32. අලියා ලී කොටන් වගයක් ගේන්න ආයෙත් ගියාට පස්සෙ නරියා කඹේ විකන්න හිතාගන උඩ පැන්නා. එතකොට ඌ 'ඩොග්' ගාලා බොරු වළ ඇතුළට ඇදන් වැටුණා.





33. ''අන්න නරියා උගුලට අහු වෙලා, උගුලට අහුවෙලා!'' ලේනයි හාවයි ගොරිල්ලයි මේ විදියට ප්‍රීති ඝෝෂා කරන්න පටන් ගත්තා.



34. අලියා ආපහු ඇවිල්ලා බලන කොට නරියා බොරු වළ ඇතුළෙ! අලියා දැකලා නරියා හරියට බය වුණා. ඌට සිහිය නැති වුණා. සිහිය ආවාට පස්සෙ, ඌ වළෙන් ගොඩ එන්න දැඟලුවා. අලියා හොඬ වැල දාලා, නරියා ඇදලා අරගෙන ඔයට වීසි කෙරුවා.





35. ලේනා අප්පුඩි ගැහුවා. හාවා නට නට වටේට දිව්වා. අලියා හොඬ වැල වන වන උන්නා. ගොරිල්ලා ''බක බක'' ගාලා මහ හයියෙන් හිනහ වුණා. ඒ පාර අනිත් තුන් දෙනාත් ගොරිල්ලා එක්ක එකට හිනහ වෙන්න පටන් ගත්තා.

36. යාළුවෝ හතර දෙනා එකමුතු වෙලා වැඩ කරපු නිසා අලුත් පාලම හද ගන්න පුළුවන් වුණා.





37. අර බලන්න! දැන් ඉර බහින වෙලාව. අලුත් පාලම රත්තරන් පාටයි. ගොරිල්ලා, අලියා, හාවා, ලේනා කියන යාළුවො හතර දෙනා අලුත් පාලම දිගේ පේලියට යනවා. ඒ ගොල්ලන්ගෙ කූඩවල ගෙඩි ජාති පිරිලා තියනවා. ඒවා ගෙනියන්නෙ සීත කාලෙට කන්න ගබඩා කරලා තියාගන්නයි.